# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1830/42 - 2013 ඔක්තෝබර් මස 02 වැනි බදාදා - 2013.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

64 (1) වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 64 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් පවත්වා ගෙන යනු ලබන අකුරැස්ස ජල සම්පාදන ක්‍රමයේ ජල සැපයීම් කටයුතු සම්බන්ධයෙන් එකී පනතේ 63 (1) වන වගන්තිය යටතේ මා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමයේ විධිවිධාන මෙම නියමය මඟින් මෙහි පහත උපලේඛනයේ ඇතුළත් කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2013 ජුනි මස 24 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

61 (1) වගන්තිය - ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමයේ ඇතුළත් දේ :

(අ) පහත දැක්වෙන සියළුම චංචල හා නිශ්චල දේපල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා මණ්ඩලය සතු කළ යුතුය. එනම් :

(i) අකුරැස්ස ජලසම්පාදන ව්‍යාපෘතියේ පිහිටි සියළුම ජල මූලාශ්‍ර, ජල කුළුණු, පීඩන සිඳින ටැංකි හා පොම්ප කිරීමේ ස්ථාන ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට අවශ්‍ය සියළුම ඉඩම්, ගොඩනැගිලි, ජල නල සියළුම යාන්ත්‍රික හා විදුලි යන්ත්‍රෝපකරණ, යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීමට අවශ්‍ය සියළුම අමතර කොටස් අතුරු උපකරණ හා ගබඩා ද්‍රව්‍ය.

(ii) අකුරැස්ස ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි ජලය බෙදාහැරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට අවශ්‍ය ජල නල මාර්ග වල පරවශතාවයන්, අමතර කොටස්, අතුරු උපකරණ හා ගබඩා ද්‍රව්‍ය සමඟ සියළුම ප්‍රධාන ජල නල බෙදාහැරීමේ ජල නල මාර්ග.


1A - G 18346 — 175 (2013/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

(ආ) ඉහත සඳහන් දේපළ හා සම්බන්ධව සැලසුම් කිරීම, සවි කිරීම්, ඉදිකිරීම්, ක්‍රියාත්මක කිරීම් හා නඩත්තු කිරීම් පිළිබඳව අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් බැඳී ඇති කවර හෝ කොන්ත්‍රාත්තුද, සභාවේ අයිතිවාසිකම්, බැඳීම් හා වගකීම් මණ්ඩලය වෙත පවරණු ලැබේ.

(ඇ) ජලය භාවිතා කිරීම හා ජල සේවා සැපයීම සම්බන්ධයෙන් ජල පාරිභෝගිකයන් සමඟ අකුරැස්ස ප්‍රාදේශීය සභාව බැඳී ඇති සියළුම ගිවිසුම්ද, ඒ සේවාවන් ලබා ගැනීම සම්බන්ධයෙන් කළ යුතු ගෙවීම්ද මණ්ඩලය වෙත පවරනු ලැබේ.

(ඈ) රුපියල් 4,175,676/- ක් (රුපියල් හතලිස් එක් ලක්ෂ හැත්තෑ පන්දහස් හයසිය හැත්තෑ හයක්) වටිනා මේ පහසුකම් වල වත්කම් ආධාර මුදලක් වශයෙන් රජය විසින් මණ්ඩලය වෙත ප්‍රදානය කරනු ලැබේ.

(ඉ) ජලය සැපයීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව ඇතුළත් වූ සියළුම ගිවිසුම් මණ්ඩලය විසින් නොකඩවා පවත්වා ගෙන යනු ලබන අතර, ගිවිසුම් සපුරාලීම ද කරනු ලැබේ.

ඉහත පැවරුම මෙම නිවේදනය පළවූ දින සිට ක්‍රියාත්මක වනු ඇත.

10 - 520

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.